" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
General Telephone - 011 - 2093000

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01
ISO 9001

| මගේ අංකය / எனது இல. / My No. | CSWP/ADM/30-38/FI/01(2025) | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025.05.20 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.05.19 දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | විස්තරය |
|---|---|---|
| 01. | ස්වදේශ කටයුතු චක්‍රලේඛ 04/2025 හා 2025.04.29 | රාජ්‍ය වෙසක් මහෝත්සවය සැමරීම - ශ්‍රී බුද්ධ වර්ෂ 2569 |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2025 හා 2025.05.09 | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය - ආපදා ණය |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන ලෙස කාර්යාලයේ ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.ඩී.ඒ. ලක්මාල් රූපසිංහ,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092606
ෆැක්ස් අංකය : 011-2092605
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 04/2025

මගේ අංකය : එච්ඒ/1/2/2022
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය, කොළඹ 07

2025.04.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>රාජ්‍ය වෙසක් මහෝත්සවය සැමරීම - ශ්‍රී බුද්ධ වර්ෂ 2569</u>**

1. ශ්‍රී සම්බුදු තෙමඟුල සිහිකරමින් පැවැත්වෙන වෙසක් පුණ්‍යමහෝත්සවය මුල්කරගෙන 2025 වර්ෂයේ මැයි මස 10 දින සිට මැයි මස 16 දින දක්වා **"වෙසක් සතිය"** වශයෙන් අමප/25/069/822/015 හා 2025.04.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ප්‍රකාශයට පත්කර ඇත.

2. ඒ අනුව සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ මඟපෙන්වීම අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහාය ඇතිව වෙසක් උත්සවය අභිමානවත් අයුරින් දිවයින පුරා පැවැත්වීමට කටයුතු සංවිධානය කරනු ඇත.

   මෙවර රාජ්‍ය වෙසක් උළෙලේ තේමා පාඨය,

   **"භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ" වේ.**

   **(කලණ ගුණ ඇති උතුම් මිතුරන් ඇසුරු කරමු)**

3. සම්බුදු තෙමඟුල සමරන 2025 මැයි මස 10 වන දින සිට මැයි මස 16 දින දක්වා වන වෙසක් සතිය තුල සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල, නිවාසවල බෞද්ධ කොඩිය ඔසවා තැබීමත් එම ගොඩනැගිලි පරිසර හිතකාමී වෙසක් සැරසිලි වලින් අලංකාර කිරීමත් කළ යුතු වේ.

4. ශ්‍රී බුද්ධ වර්ෂ 2569 වන රාජ්‍ය වෙසක් මහෝත්සවය 2025 වර්ෂයේ මැයි මස 10 දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන විහාරස්ථානයේදී පැවැත්වෙන අතර ඊට සමගාමීව වෙසක් සතිය තුළ දිවයිනේ සියලු විහාරස්ථාන කේන්ද්‍රකර ගනිමින් අධ්‍යාත්මික සංවර්ධනයට මුල්තැන දෙමින් අර්ථවත් හා ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව දිවයින පුරා ඇති සියලුම විහාරස්ථාන, දහම්පාසල්, පාසල්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ආශ්‍රිතව ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩලවල පූර්ණ මාර්ගෝපදේශකත්වයෙන් යුතුව

වෙසක් සතියෙහි ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

**වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්**

I. **2025.05.10 රාජ්‍ය වෙසක් උත්සවය හා ඊට සමාගාමීව දිවයින පුරා පවත්වනු ලබන වෙසක් සමාරම්භක වැඩසටහන්**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙසක් සමාරම්භක පිංකම් වැඩසටහන් පැවැත්වීම.

II. **2025.05.11 "Clean Sri Lanka" වැඩසටහනට සමගාමීව පරිසර සංරක්ෂණ වැඩසටහන් හා ශ්‍රමදාන සංවිධානය**

බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ඇසුරින් පරිසර හිතකාමී පුරවැසියන් බිහිකිරීම සඳහා බුදු දහම හා පරිසරය රැකගැනීම පිළිබඳ දේශන හා වැඩමුළු පැවැත්වීම, විහාරස්ථාන, පාසල්, පොදු ස්ථාන, කාර්යාල, නිවාස ආදිය පිරිසිදු කිරීම, වැඩිහිටි ළමා නිවාස රෝහල් ආදී පොදු ස්ථානවල ශ්‍රමදාන පැවැත්වීම, රුක් රෝපණ වැඩසටහන්, ඔසු උයන්/ වන උයන් පිහිටුවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

III. **2025.05.12 සීල භාවනා පිංකම් (වෙසක් පොහෝ දින වැඩසටහන)**

මෙදින වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය බැවින් සෑම විහාරස්ථානයකම සීල භාවනා පිංකම් පැවැත්වීම හා මෙම පිංකම්වලට දහම් පාසල්, පාසල් සිසුන් හා තරුණ පිරිස් සම්බන්ධ කරගැනීම, මෙදින සංගීත සංදර්ශන හා සැණකෙළි ආදිය පවත්වන දිනයක් බවට පත් නොකළ යුතු අතර සම්බුදු තෙමඟුල වෙනුවෙන් ප්‍රතිපත්තිමය පූජා පවත්වන පූර්ණ ආගමික දිනයක් වශයෙන් ගත කිරීමට දායක ප්‍රජාව දැනුවත් කිරීම.

IV. **2025.05.13 සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන්**

පාසල් හා දහම් පාසල් දරුවන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම, හෙළ බොදු සිරිත් විරිත්වල වටිනාකම පිළිබඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදේශන වැඩසටහන් පැවැත්වීම, සාරධර්ම පෙරහැර හා වැඩිහිටි නිවාස, ළමා නිවාස, රෝහල් වැනි ස්ථානවල සත්කාරක වැඩසටහන් පැවැත්වීම.

V. **2025.05.14 භික්ෂු හා සිල්මාතා පුහුණු වැඩසටහන්**

පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ස්වාමීන් වහන්සේලා සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම, පිරිවෙන් අධ්‍යාපනය ලබන දිස්ත්‍රික්කයේ වැඩ සිටින ඒ සඳහා අවශ්‍ය වන මූලික පහසුකම් සපයා

ගැනීමට දුෂ්කර ස්වාමීන් වහන්සේලා සඳහා ප්‍රදේශයේ සම්පත් දායකයින් හඳුනාගෙන අවශ්‍ය පහසුකම් සැලසීම.

VI. **2025.05.15** අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්

ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය ඉහළ නැංවීම උදෙසා විහාරස්ථාන කේන්ද්‍ර කරගනිමින් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, භාවනා වැඩසටහන් පැවැත්වීම. බෞද්ධ සිරිත් විරිත් හා චාරිත්‍ර විධි පිළිබඳ දහම් පාසල් දරුවන් හා තරුණ ප්‍රජාව දැනුවත් කිරීම.

VII. **2025.05.16 'සිල් සුවඳයි - හෙළ දිවියයි' සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සම්බුද්ධ දේශනාවට අනුව පවත්වන වැඩසටහන්**

නොමිලේ වෛද්‍ය සායන වැඩසටහන් සංවිධානය කිරීම, ලේ දන්දීමේ වැඩසටහන්, අක්ෂි සායන ආදිය සංවිධානය, ඇස් දන්දීම හා ශරීර කොටස් දන්දීම සඳහා ලියාපදිංචි කර ගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම, ප්‍රධාන වැඩසටහනට සමගාමීව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස ආවරණය වන පරිදි ප්‍රදේශයේ පවතින සම්පත් අනුව වැඩසටහන් කිරීම.

5. 2025.05. 12, 13 සහ 14 යන දින තුනෙහි දිවයින පුරා ඇති සියලුම සත්ත්ව ඝාතකාගාර හා සුපිරි වෙළඳසැල්හි අලෙවි කුටිද ඇතුළත්ව සියලුම මස් මාංශ අලෙවිසැල් වසා තැබීම හා දිවයින පුරා සියලුම සුරා සැල් සියලුම මත්පැන් අලෙවි ස්ථාන හා සමාජශාලා ද වසා තැබීමට කටයුතු කිරීම.

ඉහත කරුණු පිළිබඳ අවධානය යොමු කොට වෙසක් උත්සවය සැමරීමේදී බොදු පිළිවෙත් සුරකින යහපත් සමාජයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම මේ හා සම්බන්ධ වන සියලු පාර්ශව වෙත සිදු කරමින් වෙසක් සතියෙහි සෑම විහාරස්ථානයක්ම කේන්ද්‍ර කරගෙන අර්ථවත් හා ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් බෞද්ධ සාරධර්මයන්ගෙන් පෝෂණය වූ සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැඟීම උදෙසා සැවොම දායක විය යුතුය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්

| | | |
|---|---|---|
| 1 | අතිගෞරවණීය මහානායක ස්වාමීන් වහන්සේ | - ගෞරවණීය දැනගැනීම සඳහා |
| 2 | ගරු සභාපති/ ගරු ලේකම් ස්වාමීන් වහන්සේ, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය | - ගෞරවණීය දැනගැනීම සඳහා |
| 3 | ජනාධිපති ලේකම් | - කරු. දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 4 | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු. දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 5 | ලේකම්, බුද්ධශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | |